සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය පිරිවෙන් අධ්‍යාපන අංශය -/ Ministry of Education – Division of Piriven Education / கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு

**පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය - 2025**

**4 ශ්‍රේණිය**

| 07 | S | I,II |
|---|---|---|

**පැය එකයි.**

# (07) ඉතිහාසය - I, II

**අමතර කියවීම් කාලය - විනාඩි 10**

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍ර කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

## ඉතිහාසය - I පත්‍රය

**සැලකිය යුතුයි:**

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40ක් ලැබේ.**
- **අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.**
- **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැපයෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
- **එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.**

---

➢ **අංක 01 සිට 15 තෙක් එක් එක් ප්‍රශ්නයට ගැළපෙන පිළිතුර තෝරන්න.**

01. අවසන්වරට අනුරාධපුර ක්‍රමවත් පාලනයක් ගොඩනගා ගත් පාලකයා කවුරුන් ද?
    (1) පළමු අග්බෝ රජු  (3) හතරවන මහින්ද රජු
    (2) පස්වන මිහිඳු රජු  (4) පණ්ඩුකාභය රජු

02. අනුරාධපුර සිංහාසනය සඳහා නිරන්තර අරගල පැවති රාජවංශ දෙක කුමක් ද?
    (1) පාණ්ඩ්‍ය හා ලම්භකරණ  (3) මෞර්ය හා ලම්භකරණ
    (2) මෞර්ය හා පාණ්ඩ්‍ය  (4) කාලිංග හා නායක්කාර්

03. ඉන්දීය කුලී හමුදාවන්ගේ ආධාරයෙන් මෙරට බලයට පත් පළමු පාලකයා කවු ද?
    (1) සිරිවල්ලභ  (3) කිත්සිරිමේඝ
    (2) මානාභරණ  (4) ඉලනාග


www.piripela.lk

04. පොළොන්නරු රාජධානියේ ආරම්භක පාලකයා කවුරුන් ද?

(1) පළමුවන විජයබාහු රජු
(3) පළමුවන පරාක්‍රමබාහු රජු
(2) තුන්වන විජයබාහු රජු
(4) දෙවන පරාක්‍රමබාහු රජු

05. ක්‍රි.ව. 1017 දී රජරට ආක්‍රමණය කර පස්වන මිහිඳු සිරකරුවෙකු ලෙස ඉන්දියාවට රැගෙන ගිය පාලකයා කවුරුන් ද?

(1) මහා රාජරාජ
(3) කුලෝත්තුංග
(2) පළමුවන රාජේන්ද්‍ර
(4) සංකිලි

06. දෙවන ගජබාහු රජු හා පරාක්‍රමබාහු රජු අතර සමගි සන්ධානයක් ඇති කිරීම සඳහා ගිවිසුමක් අත්සන් කළ බව සඳහන් පුරා විද්‍යා මූලාශ්‍රය කුමක් ද?

(1) සංගමු විහාර ලිපිය
(3) හැබැස්ස ලිපිය
(2) තම්මැන්නා ලිපිය
(4) ගල්විහාර ලිපිය

07. පළමුවන පරාක්‍රමබාහු රජුගේ වාරිමාර්ග කටයුතු අතර වැදගත්ම කාර්ය වූයේ,

(1) මහකනදරා වැව ඉදිකිරීමයි.
(3) පරාක්‍රම සමුද්‍රය ඉදිකිරීමයි.
(2) අංගමු වැව ඉදිකිරීමයි.
(4) පාඬික්කුලම් වැව ඉදිකිරීමයි.

08. ලක්දිව වැඩිම ශිලා ලේඛන සංඛ්‍යාවක් ප්‍රතිෂ්ඨාපනය කළ පාලකයා කවුරුන් ද?

(1) මහා පරාක්‍රමබාහු රජු
(3) පස්වන බුවනෙකබාහු රජු
(2) මහා විජයබාහු රජු
(4) නිශ්ශංකමල්ල රජු

09. චෝලයන් විසින් අනුග්‍රහය දැක්වූ බෞද්ධ විහාරය කුමක් ද?

(1) ගිරිදන්ඩන වෙහෙර
(3) වෙල්ගම් වෙහෙර
(2) මහාබෝධි විහාරය
(4) රන්කොත් වෙහෙර

10. වන්නි විජයබාහු නමින් හඳුන්වන පාලකයා කවුරුන් ද?

(1) තුන්වන විජයබාහු රජු
(3) තුන්වන වික්‍රමබාහු රජු
(2) පළමුවන විජයබාහු රජු
(4) දෙවන අග්බෝ රජු

11. පන්සිය පනස් ජාතක පොත සිංහල භාෂාවෙන් ලිවීමට අනුග්‍රහය දැක්වූ පාලකයා කවුරුන් ද?

(1) පළමුවන පරාක්‍රමබාහු රජු
(3) හයවන පරාක්‍රමබාහු රජු
(2) දෙවන පරාක්‍රමබාහු රජු
(4) සිවුවන පරාක්‍රමබාහු රජු


www.pirivena.lk

12. "පැරකුම්බා සිරිත" යන සාහිත්‍ය ග්‍රන්ථය රචනා කළ යුගය කුමක් ද?

(1) දඹදෙණිය (3) කෝට්ටේ

(2) අනුරාධපුර (4) ගම්පොළ

13. ලංකාවට පෘතුගීසි ගොඩබසින විට කෝට්ටේ පාලකයා කවුරුන් ද?

(1) අටවන වීර පරාක්‍රමබාහු රජු (3) ධර්මපාල රජු

(2) සේනාසම්මත වික්‍රමබාහු රජු (4) මායාදුන්නේ රජු

14. ක්‍රි. ව. 1519 දී පරරාජසේකරම් රජු මරා බලයට පත්වුයේ කවුරුන් ද?

(1) ආර්ය චක්‍රවර්තී (3) සංකිලි

(2) රාජේන්ද්‍ර චෝළ (4) එදිරිමාන්නසිංහම්

15. බයිබලය සිංහලයට පරිවර්තනය කිරීමට මුද්‍රණ ශිල්පය හඳුන්වාදුන් වර්ෂය කුමක් ද?

(1) ක්‍රි. ව. 1732 (3) ක්‍රි. ව. 1738

(2) ක්‍රි. ව. 1735 (4) ක්‍රි. ව. 1739

➢ **අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් හතර බැගින් ලබා දී ඇත. ඒවා අතරින් එක් නමක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ නොගැළපේ. එම නොගැළපෙන නාමය තෝරන්න.**

16. (1) සොක්‍රටීස් (3) ප්ලේටෝ

(2) ඇරිස්ටෝටල් (4) සීසර්

17. (1) පෘතුගාලය (3) ජර්මනිය

(2) ඕලන්දය (4) ප්‍රංශය

18. (1) කෝට්ටේ (3) රයිගම

(2) සෙංකඩගල (4) සීතාවක

19. (1) අනුරාධපුර (3) දෙවුන්දර

(2) පොළොන්නරුව (4) ගම්පොළ

20. (1) කුරු (3) චේදි

(2) කාසි (4) නර්මදා


www.pirivena.lk

➢ **අංක 21 සිට 25 තෙක් ප්‍රශ්නවල නාම /ප්‍රකාශන යුගල හතර බැගින් ලබා දී ඇත. ඒවා අතරින් එක් නාම /ප්‍රකාශන යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන නාම /ප්‍රකාශන යුගලය තෝරන්න.**

21. (1) නිශ්ශංකමල්ල රජු - පොළොන්නරුව
(2) දෙවන පරාක්‍රමබාහු රජු - දඹදෙණිය
(3) පළමු බුවනෙකබාහු රජු - යාපහුව
(4) තුන්වන පරාක්‍රමබාහු රජු - කුරුණෑගල

22. (1) අංග - චම්පා
(2) මල්ල - කුසිනාරා
(3) සූරසේන - මධුරා
(4) වජ්ජි - බරණැස

23. (1) ගෘහ භාණ්ඩ - මේසය
(2) ආහාර - සලාද
(3) සංගීතය - කපිරිඤ්ඤා
(4) අධ්‍යාපනය - ගීතිකා

24. (1) දන්තුරේ - ක්‍රි. ව. 1594
(2) බලන - ක්‍රි. ව. 1602
(3) උදන්විට - ක්‍රි. ව. 1867
(4) රන්දෙණිවල - ක්‍රි. ව. 1630

25. (1) ක්‍රි. ව. 1639 - ත්‍රිකුණාමලය
(2) ක්‍රි. ව. 1640 - මීගමුව
(3) ක්‍රි. ව. 1652 - කළුතර අඟුරුවාතොට
(4) ක්‍රි. ව. 1650 - කොළඹ කොටුව


www.pirivena.lk

➢ **අංක 26 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති (A), (B), (C) හා (D) යන ප්‍රතිචාර හතරක් දී ඇත. ඒවා අතුරින් දෙකක් නිවැරදිය. එම නිවැරදි ප්‍රතිචාර දෙක තෝරන්න.**

26. අනුරාධපුර රාජධානිය පරිහානියට පත්වීම සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ වන්නේ,

A. වාරිකර්මාන්තය හා කෘෂිකර්මාන්තය බිඳවැටීම.

B. අනුරාධපුර පාලකයින් අනුගමනය කළ විදේශ ප්‍රතිපත්තිය.

C. ආසන්නම හේතුව කාලිංග මාඝ ආක්‍රමණය.

D. පාන්ඩ්‍ය වැසියන්ගෙන් එල්ල වූ විරෝධය

1. B සහ C ය 2. A සහ B ය 3. A සහ D ය 4. C සහ D ය

27. දෙවන පරාක්‍රමබාහු රජතුමා සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ වන්නේ,

A. මෙතුමාගේ රාජ්‍ය වර්ෂය (ක්‍රි. ව. 1232 - ක්‍රි.ව. 1236) දක්වාය.

B. චන්ද්‍රභානු නම් ආක්‍රමණිකයෙක් දෙවරක්ම ආක්‍රමණය කිරීම.

C. බෙලිගල තැම්පත් කර තිබූ දළදාව දඹදෙණියට වැඩම කරවීම.

D. වත්තල විජයබාහු විහාරය කරවීම.

1. B සහ C ය 2. A සහ B ය 3. A සහ D ය 4. C සහ D ය

28. ගම්පොළ රාජධානිය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ වන්නේ,

A. සේනාධිලංකාර සෙනෙවිරදුන් ලංකාතිලක විහාරය කරවීම.

B. සීලවංස ධම්මකිත්ති හිමි කාසගල්ල විහාරය කරවීම.

C. මහනුවර අස්ගිරි විහාරය බිහි කිරීම.

D. දෙවනගල වනරතන හිමිගේ උපදෙස් මත ශාසනශෝධනයක් ඇති කිරීම.

1. B සහ C ය 2. A සහ B ය 3. A සහ D ය 4. C සහ D ය

29. යුරෝපීය ජාතීන් පෙරදිගට පැමිණීමට බලපෑ සාධක සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ වන්නේ,

A. දේශ ගවේෂණයේ ප්‍රථම රටවල් දෙක ප්‍රංශය හා රුසියාවයි.

B. 1638 දී උඩරට රජුට සහය දීම.

C. කොන්ස්තන්තිනෝපල් වරායේ සිට චීනය දක්වා තිබූ මුහුදු සේද මාවත අවහිර වීම.

D. වෙළඳ වාසි ලබා ගැනීම.

1. B සහ C ය 2. A සහ B ය 3. A සහ D ය 4. C සහ D ය


www.pirivena.lk

30. ලන්දේසි පාලනය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ වන්නේ,

A. 1602 දී ලන්දේසි දූතයෙකු වූ ජෝරිස් වැන් ස්පිල්බර්ජන් ලංකාවට පැමිණීම.

B. කොනප්පු බණ්ඩාර යටතේ උඩරටට ආක්‍රමණයන් එල්ල කිරීම.

C. යමසිංහ බණ්ඩාර ජොන් ප්‍රවාන් නමින් බෞතීස්ම වීම.

D. යාපනයේ පැවති තෙසවලාමෙ නීති ක්‍රමය යාවත්කාලීන කිරීම.

1. B සහ C ය 2. A සහ B ය 3. A සහ D ය 4. C සහ D ය

- **අංක 31 සිට 36 දක්වා ඇති නාම/ ප්‍රකාශන සමූහයේ X හා Y තීරුවල දී ඇත. X තීරුවේ දී ඇති නාම / ප්‍රකාශන Y තීරුවේ නාම /ප්‍රකාශන සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නොවේ. X තීරුවේ ඒවා Y තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙලට සකස් කළ විට ලැබෙන නිවැරදි පිළිතුරු තෝරන්න.**

31.

| X | Y |
|---|---|
| 1. විජයසුන්දරාරාමය | A. තුන්වන විජයබාහු රජු |
| 2. පොළොන්නරු කිරිවෙහෙර | B. පළමුවන පරාක්‍රමබාහු රජු |
| 3. සුනේත්‍රා දේවි පිරිවෙන | C. හයවන පරාක්‍රමබාහු රජු |
| 4. දෙවුන්දර පටිමාඝරය | D. සිවුවන පරාක්‍රමබාහු රජු |

1. ABCD 2. BCDA 3. ABDC 4. ACBD

32.

| X | Y |
|---|---|
| 1. ලෙඩරෝග | A. පරංගි |
| 2. වාස්තුවිද්‍යාව | B. කේතු ආකාර උස්වහල |
| 3. ඇඳුම් | C. ගාංචු |
| 4. පුද්ගලනාම | D. මැල් |

1. DBCA 2. ABCD 3. DCBA 4. BCDA


www.pirivena.lk

33. X | Y

| X | Y |
|---|---|
| 1. කන්ද උඩරට ද්‍රෝහියා | A. කොනප්පු බණ්ඩාර |
| 2. රන්දෙණිවල සටන | B. කුසුමාසන දේවි |
| 3. දෝන කතරිනා | C. පළමුවන සෙනරත් රජුගේ පුතු |
| 4. දොන් ජුවාන් | D. පළමුවන විමලධර්මසූරිය රජු |

1. BCDA 2. ABCD 3. DCBA 4. DCAB

34.

| X | Y |
|---|---|
| 1. දස අවුරුදු සාම ගිවිසුම | A. ක්‍රි. ව. 1521 |
| 2. අට්ටාපිටිය ගිවිසුම | B. ක්‍රි. ව. 1638 |
| 3. උඩරට ලන්දේසි ගිවිසුම | C. ක්‍රි. ව. 1642 |
| 4. විජයබා කොල්ලය | D. ක්‍රි. ව. 1634 |

1. CDAB 2. ABCD 3.CBAD 4. CDBA

35.

| X | Y |
|---|---|
| 1. ඉංග්‍රීසින් | A. ඕලන්දය |
| 2. ලන්දේසින් | B. පෘතුගාලය |
| 3. පෘතුග්‍රීසීන් | C. බ්‍රිතාන්‍ය |
| 4. ප්‍රංශයින් | D. ප්‍රංශය |

1. CADB 2. CABD 3. CBDA 4. CBAD


www.pinwana.lk

36. අංක **36** සිට **40** දක්වා ඇති එක් එක් ප්‍රශ්නයෙහි ප්‍රකාශ දෙක බැගින් ඇතුළත් වේ. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන **1,2,3,4** යන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා ඊට අදාළ අංකය සලකුණු කරන්න.

| වරණ අංකය | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදි ය. | නිවැරදි ය. |
| 2 | නිවැරදි ය. | වැරදි ය. |
| 3 | වැරදි ය. | වැරදි ය. |
| 4 | වැරදි ය. | නිවැරදි ය. |

| | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| **36** | පළමුවන විජයබාහු රජු රාජ්‍යයට පත්වීමට පෙර හැඳින්වුයේ කිත්ති නමිනි. | මෙතුමා කාලිංග දේශයෙන් තිලෝකසුන්දරී නම් කුමාරිකාව විවාහ කර ගත්තේය. (……) |
| **37** | "අහසින් වැටෙන එක දියබිඳකුදු ප්‍රයෝජනයට නොගෙන මුහුදට ගලා යාමට ඉඩ නොදිය යුතුය" මෙය මහා පරාක්‍රමබාහු රජුගේ ආදර්ශ පාඨයකි. | මෙතුමා උරුවේල වැව ඉදිකරන ලදී. (……) |
| **38** | කාලිංග මාඝ වසර හතලිස් හතරක කාලයක් රජරට පාලනය කළේය. | මහා පරාක්‍රමබාහු රජතුමා තිස්වසරක කාලයක් තුළ අමුණු 165 ද ඇළවල් 3910 ද කරවන ලද බව වංස කතාවේ සඳහන් වේ. (……) |
| **39** | යාපහුව රාජධානියේ ආරම්භක පාලකයා තුන්වන පරාක්‍රමබාහු රජුය. | සුභ පබ්බතය යාපහුව ලෙස හැඳින්වේ. (……) |
| **40** | ලොරෙන්සෝද අල්මේදා ඇතුළු නාවික පිරිස ක්‍රි. ව. 1505 දී ලංකාවට පැමිණ ඇත. | කෝට්ටේ දළදා මැදුරේ තැන්පත් කර තිබූ දළදා වහන්සේ, හිරිපිටියේ නිළමේ විසින් සීතාවකට වැඩම කර දෙල්ගමු විහාරයේ කුරහන් ගලේ සඟවා තබන ලදී. (……) |


www.pinthura.lk

සියලුම හිමිකම් ඇවිරිණි]
முப்பு பாதிப்புஜரிமையஜடையது]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය පිරිවෙන් අධ්‍යාපන අංශය -/ Ministry of Education – Division of Piriven Education / கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு

**පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය - 2025**

**4 ශ්‍රේණිය**

| 07 | S | II |
|---|---|---|

**පැය දෙකයි**

**(07) ඉතිහාසය - II පත්‍රය**

**සැ. යු.**

- ❖ **පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- ❖ **පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- ❖ **මෙම කොටසට ලකුණු 60 ක් හිමි වේ.**

01. I. ඔබට සපයා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියමේ පහත සඳහන් ස්ථාන ලකුණු කර, නම් කරන්න.

1. කෝට්ටේ   2. ගාල්ල   3. සෙංකඩගල
4. ත්‍රිකුණාමලය   5. යාපනය   6. මන්නාරම

(නිවැරදි ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 1 X 6 = 06)

II. (අ) A රූපයේ දැක්වෙන මාළිගාව කුමක් ද?

(ආ) මෙය කුමන රජුගේ නිර්මාණයක් ද?

(ඉ) මෙය අයත් ඓතිහාසික නගරය කුමක් ද?



(ලකුණු 03)

A රූපය

III. (අ) B රූපයේ දැක්වෙන පුද්ගලයා කවුරුන් ද?

(ආ) මෙතුමා පුරෝගාමියා ලෙස කටයුතු කළේ කුමක් සඳහා ද?

(ඉ) මෙතුමා ගවේෂණය සිදුකළ සියවස කුමක් ද?



(ලකුණු 03)

B රූපය


www.pirivena.lk

02. I. අනුරාධපුර රාජධානියේ ආරම්භක පාලකයා සහ අවසාන වැදගත් පාලකයා කවුරුන් ද? (ලකුණු 02)

II. අනුරාධපුර රාජධානිය බිඳවැටීමට බලපෑ හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

III. කෘෂිකර්මාන්තය පදනම් කරගෙන අනුරාධපුර යුගයේ පාලකයන් අනුගමනය කළ චාරිත්‍රාක්ෂණය කෙටියෙන් පහදන්න. (ලකුණු 06)

03. I. පොළොන්නරු රාජධානිය හඳුන්වන වෙනත් නම් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II. මහා විජයබාහු රජතුමාගේ දියණියන් සිව්දෙනෙකු නම් කරන්න. (ලකුණු 04)

III. මෙම රජුගේ ආර්ථික මෙහෙවර කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

04. I . නිශ්ශංකමල්ල රජුගේ දෙමව්පියන් නම් කරන්න. (ලකුණු 02)

II. රාජ්‍යත්වය තහවුරු කර ගැනීමේදී නිශ්ශංකමල්ලට මුහුණ දීමට සිදු වූ අභියෝග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

III. මහා පරාක්‍රමබාහු රජුගේ ආගමික සේවා කෙටියෙන් පහදන්න. (ලකුණු 06)

05. I. හයවන පරාක්‍රමබාහු රජතුමා වැඩි දියුණු කළ පූජනීය ස්ථාන දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II. මෙතුමා පිළිබඳ අධ්‍යයනය කිරීමට ඇති මූලාශ්‍රය හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

III. සිංහල පද්‍ය සාහිත්‍යයේ ස්වර්ණමය යුගය ලෙස කෝට්ටේ යුගය හඳුන්වා දිය හැක. මේ පිළිබඳ කෙටියෙන් පහදන්න. (ලකුණු 06)

06. I. උඩරට රාජ්‍යයේ පැවති විවාහ සම්ප්‍රදායන් දෙකක් නම් කරන්න. ලකුණු 02)

II. පෘතුගීසීන්ගේ උඩරට ආක්‍රමණය අසාර්ථක වීමට බලපෑ හේතු දෙකක් දක්වන්න. (ලකුණු 04)

III. ලංකාවට පෘතුගීසීන් පැමිණීමෙන් ආගමික අංශයේ බලපෑම් වර්ධනය විය. මෙය කෙටියෙන් පහදන්න. (ලකුණු 06)


www.pirivena.lk

07. I. ලන්දේසීන් මෙරට පැමිණීමට බලපෑ හේතු දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II. ලන්දේසි මුහුදුබඩ ප්‍රදේශ පාලනය කිරීම සඳහා යොදාගත් කොමාන්ඩරි දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

III. ක්‍රි. ව. 1638 ගිවිසුමේ පිටපත් දෙකෙහි වෙනස්කම් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

08. පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් පිළිබඳ ඓතිහාසික තොරතුරු විස්තර කරන්න.

1. රජරට චෝළ පාලනය

2. තුන්වන වික්‍රමබාහු

3. මුහුදුබඩ ප්‍රදේශවල ලන්දේසි පාලනය

4. යාපන රාජ්‍යය හා පෘතුගීසීන් අතර සම්බන්ධතා

(ලකුණු 6 x 2 = 12)


www.pirivena.lk